# මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ සිද්ධි 722ක් ලැබිලා

## රාජ්‍ය බලය හා දේපළ අයුතු භාවිතය ගැන පැමිණිලි 54ක්

### – 'පැෆරල්' සංවිධානය

**එච්.අයි. තුෂාර**

මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ සිද්ධීන් හත්සිය විසි දෙකක් ඊයේ (13දා) දිනය වනවිට තම සංවිධානයට ලැබී තිබෙන බව 'පැෆරල්' සංවිධානය සඳහන් කරයි.

මෙහිදී රාජ්‍ය බලය සහ දේපළ අයුතු ලෙස භාවිත කිරීම පිළිබඳ පැමිණිලි පනස් හතරක් ලැබී ඇතැයි 'පැෆරල්' සංවිධානය සඳහන් කරයි.

රාජ්‍ය වාහන මැතිවරණ කටයුතුවලට යොදා ගැනීම පිළිබඳ පැමිණිලි 7ක්, රාජ්‍ය නිලධාරීන්ට බලපෑම් කිරීම පිළිබඳ පැමිණිලි 3ක්, රාජ්‍ය නිලධාරීන් පත්කිරීම හා මාරු කිරීම පිළිබඳ පැමිණිලි 7ක්, රාජ්‍ය දේපළ හා බලය භාවිතය පිළිබඳව පැමිණිලි 13ක්, ආරක්ෂක අංශ දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම් පිළිබඳව පැමිණිලි 13ක්,රජයේ ආධාර දේශපාලන අර්ථයෙන් ලබාදීම් 11ක් ද මේ යටතට ලැබී ඇති බව එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

එමෙන්ම නීති විරෝධී ප්‍රචාරණ කටයුතු පිළිබඳ පැමිණිලි හාරසිය හතළිස් දෙකක් ලැබී තිබෙන බවත් ඒ මහතා සඳහන් කළේය.

දේශපාලන අරමුණු සහිත සංග්‍රහ කිරීමේ සිද්ධීන් හැත්තෑ හතරක්, මැතිවරණ කටයුතුවලදී සෞඛ්‍ය නීති උල්ලංඝනය කිරීම පිළිබඳ සිද්ධීන් හැටක් වශයෙන් පසුගිය ජූනි මස 13 වන දින සිට ඊයේ (13දා) දිනය දක්වා කාලය තුළ මෙම පැමිණිලි ලැබී තිබෙන බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා වැඩිදුරටත් පවසා සිටියේය.